# වලස් පැංචාගේ නුවණ



නෙතුලි දහම්සා රණසිංහ

# වලස් පැංචාගේ නුවණ

නෙතුලි දහම්සා රණසිංහ

# වලස් පැංචාගේ නුවණ

## නෙතුලි දහම්සා රණසිංහ

කතෘ

## පළමු දිගහැරීම

මහ/මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර
1 ශ්‍රේණිය - C
2025-02-08

9786242084190

# පිදුම

**පුරා වසරක කාලයක් මාගේ නැණස විවර කරන්නට උර දුන් මා සදාදරණීය මහාමායා මෑණියනි, මාගේ ලේඛන දිවියේ ප්‍රථම වෑයම වන මෙම ළමා ප්‍රබන්ධය මෙලෙස ඔබට බැතියෙන් පුදනෙමි..............**

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද  සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේනම් මහාමායා ඉතිහාසසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනිමට අප ගත් කතුවරියන් සමත් වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිණිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනා ගනිමින් ලේඛනකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළි දකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන් ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

**විදුහල්පතිණිය**
**ශෂිකලා සේනාධීර**
**මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර**

වලස් පැංචයි හා පැංචයි කාලෙක ඉඳන් ගොඩාක් හොඳ යාළුවෝ දෙන්නෙක්. මේ දෙන්නම හිටියේ දෙන්නම එකතු වෙලා හදාගත්ත ලස්සන ම ලස්සන පුංචි ගෙදරක.



දවසක් වලස් පැංචයි හා පැංචයි දෙන්නම උදෙන්ම අවදි වෙලා කෑම හොයාගෙන එන්න කැලේ ඇතුළට ගියා. ඇති තරම් පලතුරු, එළවළු, කොළ ජාති කඩාගෙන සතුටින් ගෙදර යන්න ගියා.



කැලේ හිටිය නරියෙක් හා පැංචාව දැකලා මෙහෙම හිතුවා.

“ආ........ මේ තියෙන්නේ අපූරු කෑමක්. දවස් ගාණකින් හරියට ගොදුරක් හොයාගන්නත් බැරි වුණා.


මේ හා පැංචාව අල්ලා ගත්තොත් මට ඇති තරම් බඩ පිරෙන්න කන්න පුලුවන්.”



මෙහෙම හිතුව නරියා හා පැංචාගේ පිටිපස්සෙන් එන වලස් පැංචාව දැක්කේ නෑ. එක පාරටම හා පැංචාගේ ඉස්සරහට පැනලා හා පැංචාව බය කළා. හා පැංචා බයේ වෙවුලන්න පටන් ගත්තා.

වලස් පැංචා එක පාරටම නරියාගේ ඉස්සරහට පැනලා මෙහෙම කීවා. “ අනේ.. අනේ.. කපටි නරිහාමි.... මගේ යාළුවාව කන්න නේද හැදුවේ?

හා පැංචා තනියම යනවා කියලා හිතලා ඉස්සරහට පැන්න නරියා වලස් පැංචා දැකලා හොඳටම බය වුණා.



“අනේ මට සමාවෙන්න වලස්හාමි. හා පැංචා බය වෙලාද? මම සෙල්ලමටනේ එයා ගාවට පැන්නේ.” කපටි නරියා කීවා.

“ආ...... එහෙමද නරිහාමි? මාව රවට්ටන්නද හදන්නේ?

හා පැංචාට කිසිම කරදරයක් කරලා එහෙම මට අහුවෙන්න එපා.” වලස් පැංචා කීවා.

“අනේ මගෙන් හා පැංචාට කිසිම කරදරයක් වෙන්නේ නෑ වලස්හාමි.” නරිහාමි කීවා. “හා... හොඳයි නරිහාමි. එහෙනම් අපි ගිහින් එන්නම්.”

වලස්හාමි එහෙම කියලා හා පැංචා එක්ක ගෙදර යන්න පිටත් වුණා.

යන අතරතුර අඩි සද්දයක් ඇසී විපරම් කළ වලස්හාමි හොරෙන් හොරෙන් පසුපසින් එන නරිහාමිව දැක්කා.

ඊට පස්සේ ගමන වෙනස් කිරීමට තීරණය කළ වලස්හාමි හා පැංචාට මෙහෙම කීවා.

“හා පැංචෝ.... මම හිතන්නේ නරිහාමි අපි පස්සෙන් එනවා. අපි එයාට අපේ ගෙදර හොයා ගන්න බැරි වෙන්න හොඳ වැඩක් කරමු.

අපි අපේ ගෙදර වගේ කොටිහාමිගේ ගෙදර ගාවට යමු.”

“ආ...... ඒක නම් හොඳ උපායක් තමයි වලස්හාමි. අපි එහෙම කරමු.” හා පැංචා කීවා. එසේ කොටිහාමිගේ ගෙදර ගාවට යන යාළුවෝ දෙන්නා දිහා හැංගිලා බලා සිටි නරියා වේගයෙන් දිවුවා.



තවත් දවසක වලස්හාමි හා පැංචාව ගෙදර තියලා තනියම කැලේට ගියා. ඒ බව දුටු නරිහාමි හා පැංචාව කන්න හිතාගෙන කොටිහාමිගේ ගෙදරට ගිහින් "හා පැංචෝ දොර අරින්නකෝ......." කියලා දොරට

තට්ටු කළා. දොර ඇරපු කොටිහාමිට හරි සතුටුයි. “ආ.......මට අද ගෙදරටම කෑම ලැබිලා තියෙන්නේ.....” කියලා එක පාරටම පැනලා නරිහාමිව කකුළෙන් අල්ලා ගත්තා.

කිසිවක් සිතා ගත නොහැකි වූ නරිහාමි අනූ නවයෙන් පණ බේරාගෙන කෑ ගසමින් කැලේට දිවුවා. කොටියා සමග පොරබැදූ නරිහාමිට හොඳටම තුවාල වුණා.



කැලේ ඉන්න මේ වගේ නපුරු සතුන්ට මේක හොඳ පාඩමක් වුණා. ඉතින් වලස් පැංචාගේ නුවණ නිසා එයාට යාළුවාව බේරගන්න පුලුවන් වුණා.

-නිමි-

# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල් වන සාහිත්‍ය ප්‍රබෝධයත්, අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළි දැක්වීමට වේදිකාවක් ගොඩනැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මැත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරු භවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමි විය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක් වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බව ට අනර් ථකාරී මෙන් ම සමාජය තුළ විවිධ ගැටලු, ප්‍රශ්න නිර් මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වේ. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණ යුගයේ ස්මාර් ට් බාල පරම්පරාව නූතන තක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර් මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත් කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

**ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක**
**සෙනෙවිරත්න මහලේකම්**

**ISBN 9786242084190**